පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

සතිය- 15

ශ්‍රේණිය- 12

සකස් කළේ - ඩබ්.කේ.දුලංගිකා මිය,ර/තෙප්පනාව කුමර ම.වි.

## IV ඒකකය

1) ඉලෙක්ට්‍රොනික පැතුරුම්පතක් යනු කුමක්දැයි හඳුන්වා එය භාවිතයට ගන්නා අවස්ථා මොනවාද යන්න සඳහන් කරන්න.
2) ඔබ දන්නා පැතුරුම්පත් මෘදුකාංග වර්ග 03ක් සඳහන් කරන්න.
3) වැඩපත සහ වැඩපොත අතර වෙනස කුමක්ද?
4) පහත දැක්වෙන සිද්ධිය අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

එක්තරා ළමා සමිතියක සිසුන් වෙනුවෙන් ක්‍රීඩා භාණ්ඩ මිල දී ගැනීම සඳහා අවශ්‍ය මුදල් එකතු කිරීමට කොටු කාඩ් නිකුත් කරන ලදි.

ළමුන් විසින් සති අන්තයේ දී එකතු කරන ලද මුදල් පිළිබඳ විස්තර ද, එක් එක් ශිෂ්‍යයා විසින් එකතු කරන ලද මුළු මුදල ද, එකතු වූ මුළු මුදලින් රු 50/= බැගින් කාඩ්පත් මුද්‍රණ ගාස්තු ලෙස එක් එක් ශිෂ්‍යයාගෙන් අඩු කර ඉතිරි මුදල ද ඇතුළත් තොරතුරු වැඩපතක ඇතුළත් කර ඇත. එම වැඩපත පහතින් දැක්වේ.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | No | Name | Saturday | Sunday | Total | Printing | Balance |
| 2 | 1 | Sugath | Rs 250.00 | Rs 340.00 | Rs 590.00 | Rs 50.00 | Rs 540.00 |
| 3 | 2 | Neela | Rs 450.00 | Rs 423.00 | Rs 873.00 | Rs 50.00 | Rs 823.00 |
| 4 | 3 | Prabath | Rs 300.00 | Rs 567.00 | Rs 867.00 | Rs 50.00 | Rs 817.00 |
| 5 | 4 | Mahesh | Rs 200.00 | Rs 345.00 | Rs 545.00 | Rs 50.00 | Rs 495.00 |
| 6 | 5 | Shereen | Rs 290.00 | Rs 234.00 | Rs 524.00 | Rs 50.00 | Rs 474.00 |
| 7 | 6 | Kaveesha | Rs 500.00 | Rs 100.00 | Rs 600.00 | Rs 50.00 | Rs 550.00 |
| 8 | 7 | Lankesh | Rs 650.00 | Rs 77.00 | Rs 727.00 | Rs 50.00 | Rs 677.00 |
| 9 | 8 | Jagath | Rs 350.00 | Rs 45.00 | Rs 395.00 | Rs 50.00 | Rs 345.00 |
| 10 | 9 | Suresh | Rs 200.00 | Rs 123.00 | Rs 323.00 | Rs 50.00 | Rs 273.00 |
| 11 | 10 | Sagarika | Rs 150.00 | Rs 432.00 | Rs 582.00 | Rs 50.00 | Rs 532.00 |
| 12 | 11 | Menaka | Rs 130.00 | Rs 234.00 | Rs 364.00 | Rs 50.00 | Rs 314.00 |
| 13 | 12 | Gayan | Rs 455.00 | Rs 265.00 | Rs 720.00 | Rs 50.00 | Rs 670.00 |
| 14 | 13 | Pabath | Rs 230.00 | Rs 324.00 | Rs 554.00 | Rs 50.00 | Rs 504.00 |
| 15 | 14 | Hemash | Rs 160.00 | Rs 245.00 | Rs 405.00 | Rs 50.00 | Rs 355.00 |
| 16 | 15 | Kanthi | Rs 150.00 | Rs 320.00 | Rs 470.00 | Rs 50.00 | Rs 420.00 |

Weekend Collection / Sheet2 / Sheet3

a. සිසුන් විසින් සෙනසුරාදා සහ ඉරිදා යන දෙදින තුළ උපයා ගත් මුලු මුදල සෙවීමට යතුරුලියනය කළ යුතු සූත්‍රය සඳහන් කරන්න.

b. පළමු ප්‍රතිඵලය ලබා ගැනීමට යොදාගත් සූත්‍රය අනෙකුත් ළමුන්ගේ එකතුව ලබා ගැනීම සඳහා ද ඊට අනුරූප වන ලෙස පිටපත් කර ගත හැකිය.මේ සඳහා භාවිත කළ හැකි ක්‍රම 02 මොනවාද?

c. එකතු වූ මුදලින් රු.50/=බැගින් කාඩ්පත් මුද්‍රණ ගාස්තු ලෙස ගෙවීමෙන් පසු ඉතිරි මුදල සෙවීමට යතුරුලියනය කළ යුතු සූත්‍රය සඳහන් කරන්න.

d. මෙම සිසුන් සියලුම දෙනා උපයා ගත් මුලු මුදල සෙවීම සඳහා යතුරුලියනය කළ යුතු ශ්‍රිතය සඳහන් කරන්න.